// The opening `# ` is the markdown header syntax. Removed to avoid confusion.
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2121/45 - 2019 මැයි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2019.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(x)(A).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සමාගමක් වන කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70 ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2018 අප්‍රේල් මස 19 වන දින අංක 2067/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දක්වෙන ''තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**අ. ඉබතුල් රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී :–

(i) කර්මාන්ත ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සහ රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් –

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ජීව විද්‍යා විෂයය ධාරාවෙන් 'සාමාන්‍ය සාමාර්ථ, (S) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් පදනම් පාඨමාලාවක් සමග භෞතීය විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය සහ ජෛව පද්ධති තාක්ෂණය යන විෂයයන් අතුරින් කවර හෝ විෂයය ධාරාවකට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) ; එකවර ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(ii) ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී ජීව විද්‍යාව විෂයය ධාරාවෙන් 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතුය.

(iii) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සහ කර්මාන්ත කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් –

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ වාණිජ්‍ය විද්‍යා විෂයය ධාරාවෙන් 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් එකවර ලබාතිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් පදනම් පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී කවර හෝ විෂය ධාරාවක් යටතේ 'සාමාන්‍ය සාමාර්ථ' (S) තුනක් (3) එකවර ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අදාළව කටයුතු කළ යුතු ය.

(iv) ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී ඉංග්‍රීසි විෂයය ඇතුළුව කවර හෝ විෂයය ධාරාවකින් 'සාමාන්‍ය සාමාර්ථ, (S) තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතුය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| කර්මාන්ත ඖෂධවේදී විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී. එස්. සී. ගෞරව (කර්මාන්ත ඖෂධවේදී විද්‍යාව) |
| රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී. එස්. සී. ගෞරව (රූපලාවන්‍ය නිෂ්පාදන විද්‍යාව) |
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බී. එස්. සී. ගෞරව (ජෛව වෛද්‍ය විද්‍යාව) |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී. එම්. ජී. ටී. ගෞරව (ව්‍යාපාර පරිපාලනය) |
| මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී. එම්. ජී. ටී. ගෞරව (මානව සම්පත් කළමනාකරණය) |
| කර්මාන්ත කළමනාකරණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බී. එම්. ජී. ටී. ගෞරව (කර්මාන්ත කළමනාකරණය) |
| ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී ගෞරව | බී. ඒ. ගෞරව (ඉංග්‍රීසි) |

05 - 319

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.